SDB bank

"මෙය වටිනා ලේඛනයකි"

**ඔබ විසින් ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔබට යම් සැකයක් ඇත්නම් නම්, වහාම ඔබගේ කොටස් තැරැව්කරුවාගෙන් හෝ වෙනත් වෘත්තීය උපදේශකවරයෙකුගෙන් උපදෙස් ලබාගත යුතුය.**

**කොටස්හිමියන් සඳහා වූ චක්‍රලේඛය**

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

හිතවත් කොටස්හිමියනි,

**1. ද්විතියික මහජන නිකුතුවක් (ද්.ම.නි.) මගින් කොටස් නිකුත් කිරීම.**

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී (මින් මතු "එස්ඩීබී බැංකුව/බැංකුව " යනුවෙන් හැඳින්වෙන) වත්මන් කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අවාසිසහගත ආර්ථික පසුබිමක් මධ්‍යයේ වුවද, අඛණ්ඩ ඒකාකාරී ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට සමත් විය. එස්ඩීබී බැංකු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ බදු අඩු කල පසු ඉහළතම ලාභය වන, ශ්‍රී ලංකා රුපියල් මිලියන 836 ක ලාභයක් 2020 මූල්‍ය වර්ෂයේදී ඉපැයූ බව දන්වන්නේ ඉතා සතුටිනි. මෙම කාලසීමාවේදී එස්ඩීබී බැංකුවේ ශුද්ධ පොළී ආන්තිකය (Net Interest Margin) 5.89 % ක්ව පැවතුණි.

එස්ඩීබී බැංකුවේ පස් අවුරුදු ප්‍රාග්ධන වර්ධන සැලසුමේ පළමු අදියර ලෙස, බැංකුවේ ප්‍රාග්ධනය සවි බලගැන්වීමේ අරමුණෙන්, 2020 මූල්‍ය වර්ෂයේ අවසාන භාගයේදී පවත්වන ලද හිමිකම් නිකුතුව මගින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.5 කින් ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට බැංකුව සමත් විය. තවද කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ලොව පුරා පවතින්නා වූ විවිධාකාර අභියෝගයන් මධ්‍යයේ වුවත්, දේශීය හා විදේශීය කොටස්හිමියන් සහභාගි කරවා ගනිමින් සිදු කරන ලද එස්ඩීබී බැංකුවේ හිමිකම් නිකුතුව, ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගමක් විසින් ඩිජිටල් මාධ්‍ය හරහා සිදුකරන ලද ප්‍රථම හිමිකම් නිකුතුව ලෙස ඉතිහාස ගතවන ලදී.

ඉදිරි වසර තුන සහ හතරක කාලය තුල එස්ඩීබී බැංකුවේ අපේක්ෂිත වත්කම් වර්ධනය අරමුණු කරගෙන බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධන පදනම තවදුරටත් සවිබල ගැන්වීම සඳහා, බැංකුව සිය ප්‍රාග්ධන වර්ධන වැඩපිළිවෙලෙහි දෙවැනි අදියර දියත් කිරීමට අදහස් කරයි. ඒ අනුව 2021 අප්‍රේල් මස 05 වැනි දින පැවති එස්ඩීබී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, බැංකුවේ ප්‍රාග්ධනය තවදුරටත් සවිමත් කර ගැනීම සඳහා ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මෙහි දක්වා ඇති නියමයන් යටතේ මහජනයා වෙත නිකුත් කිරීම ('ද්විතියික මහජන නිකුතුව' හෝ 'නිකුතුව' යනුවෙන් හඳුන්වනු ලබන) සඳහා වන යෝජනාව සම්මත විය.

ඉහත කී ද්විතීයික මහජන නිකුතුව සම්බන්ධයෙන් නිකුත් කරන ලද සංස්ථා ප්‍රකාශය මගින් බැංකුවේ ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන හැට අටක් (68,000,000) මිලදී ගැනීමට මහජනයා වෙත ඇරයුම් කරනු ලබන අතර (මූලික නිකුතුවේදී), යම් හෙයකින් ඉහත කොටස් ප්‍රමාණය ඉක්මවා මහජනයාගේ ඉල්ලුමක් ලැබුණහොත්, එවිට නව ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන විස්සක් (20,000,000) දක්වා වූ වැඩිදුර නිකුතුවක් සිදු කල හැකිය. ඒ අනුව බැංකුවේ මුළු කොටස් නිකුතුව මිලියන අසූ අටක් වූ (88,000,000) සමස්ත කොටස් සංඛ්‍යාවක් දක්වා (සමස්ත නිකුතුව) නිකුත් කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය ප්‍රකාරව තීරණය කල හැක.

අතිවිශේෂ මහා සභා රැස්වීමේ දිනට වෙළෙඳපොල දින තුනකට (03) පෙරාතුව බැංකුවේ මසක (01) පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල (Volume weighted average price) මත පදනම්ව කොටසක මිල (නිකුතු මිල) තීරණය කරනු ලැබේ. ඒ අනුව, ද්විතීයික මහජන නිකුතුව තුළින් කොටස් නිකුතුවේ මිල නිශ්චය කරනු ලබන දිනය වන්නේ 2021 මැයි මස 20 වන දින වේ. ඒ අනුව අතිවිශේෂ මහා සභා රැස්වීමේ දිනට වෙළඳපොල දින තුනකට (03) පෙර, බැංකුව විසින් ද්විතියික මහජන නිකුතුවේ කොටසක නිකුතු මිල වෙළඳපොල වෙත දැනුම් දෙනු ලැබේ.

ද්විතීයික මහජන නිකුතුව සම්බන්ධයෙන් කොටස් වෙළඳපොල වෙත පළමු දැනුම්දීම කරනු ලැබූ දිනය හා ඒ සඳහා කොටස්හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්වනු ලබන අතිවිශේෂ මහා සභා රැස්වීමේ දිනය අතර වන කාල පරාසය තුල බැංකුවේ කොටස් මිලෙහි සිදු විය හැකි වෙනස්කම් සලකා බලා, එකී නිකුතු මිල කොටස් වෙළඳපොල මිල මට්ටම ආසන්නයේම පවත්වා ගැනීමේ අරමුණෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහත කී මිල තීරණය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ.

ද්විතියික මහජන නිකුතුවක් තුලින් නිකුත් කරනු ලබන නව ඡන්ද හිමි සාමාන්‍ය කොටසක මිල එය නිශ්චය කරන දිනයට මසකට පෙර පැවති පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල (Volume Weighted Average Price) මත පදනම්ව තීරණය කිරීම 2007 අංක 7 දරණ සමාගම් පනතේ (සංශෝධිත) විධි විධාන ප්‍රකාරව බැංකුවට සහ එහි වත්මන් කොටස්හිමියන් සඳහා යෝග්‍ය සහ සාධාරණ බව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වේ.

එස්ඩීබී බැංකුවේ කොටස් සම්බන්ධයෙන් සක්‍රීය වෙළඳපොළක් පැවතීම හා බැංකුව පිළිබඳ පොදු මහජනතාව හට ප්‍රමාණවත් අවබෝධයක් තිබීම යන කරුණු සලකා, බැංකුවේ ඉල්ලීම පරිදි ද්විතියික මහජන නිකුතුවකදී නිකුතු මිල සාධාරණීකරණය කිරීම සඳහා සංස්ථා ප්‍රකාශයට ස්වාධීන තක්සේරුකරුවෙකු/ කළමණාකරුවෙකු විසින් නිකුත් කරන ලද තක්සේරු / පර්යේෂණ වාර්තාවක් ඇතුලත් කල යුතු බවට වන කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති 3.1.4.(c) හි සඳහන් වන අවශ්‍යතාවය, කොළඹ කොටස් හුවමාරුව විසින් සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් විමසීමෙන් අනතුරුව එම අවශ්‍යතාවය නිදහස් කිරීමට තීරණය කර ඇත.

මෙම නිකුතුව හරහා එසේ නිකුත් කරන ලද නව ඡන්ද හිමි සාමාන්‍ය කොටස් විභජනය කිරීමෙන් අනතුරුව බැංකුවේ දැනට පවත්නා ඡන්ද හිමි සාමාන්‍ය කොටස් සමග සියලු ආකාරයෙන් සමාන මට්ටමෙන් මෙන්ම සම තත්ත්වයෙන් පැවතිය යුතු අතර තවද 1988 අංක 30 දරණ බැංකු පනතේ (සංශෝධිත) දක්වා ඇති කොටස්හිමිකාරිත්වයේ සීමාවන්ට යටත්ව ප්‍රකාශිත ලාභාංශ සඳහා සහභාගී වීමේ අයිතියද හිමි වේ.

කොළඹ කොටස් හුවමාරුවේ, ලැයිස්තුගත කිරීමේ රීති 5.5 ප්‍රකාරව, සංස්ථා ප්‍රකාශයක් මගින් ද්විතියික මහජන නිකුතුවක් හරහා නව ඡන්ද හිමි සාමාන්‍ය කොටස් නිකුතුවට සහ ලැයිස්තුගත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත අයදුම්පතක් භාර දී ඇත. මෙම ද්විතියික මහජන නිකුතුව බලාත්මක වන්නේ, අති විශේෂ මහා සභා රැස්වීමේදී විශේෂ යෝජනාව කොටස්හිමියන් විසින් අනුමත කිරීම සහ ඉන් අනතුරුව කොටස් නිකුතුව සඳහා කොළඹ කොටස් වෙළඳපොළෙහි ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දීම සමග වේ.

ද්විතියික මහජන නිකුතුවට අදාළ දිනයන් බැංකුව විසින් ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ.

## 2. ද්විතියික මහජන නිකුතුව තුළින් යෝජිත කොටස් විභජනය කෙරෙන පිළිවෙල

දැනටමත් බැංකුවේ ඡන්ද හිමි සාමාන්‍ය කොටස් වෙළඳපොල වෙත නිකුත් කර ඇති හෙයින් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති 2.1.1.(g) හි සඳහන් වන අවශ්‍යතාවය වන කොටස්

නිකුතුවෙන් 20% ක් පාරිභෝගික (retail) තනි ආයෝජකයන් වෙත නිකුත් කල යුතු බවට (මහජන දායකත්ව වටිනාකම රු. බිලියන 3 ට අඩුවන අවස්ථාවන්හි දී) වන අවශ්‍යතාවය, බැංකුවේ ඉල්ලීම පරිදි කොළඹ කොටස් හුවමාරුව විසින් සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් විමසා නිදහස් කිරීමට තීරණය කර ඇත.

ද්විතියික මහජන නිකුතුවේ ධාරිතාවය (එනම්, ශ්‍රී ලංකා රු. බිලියන 3 ක් ඉක්මවූ) සැලකිල්ලට ගනිමින් සහ ඉහත සඳහන් කල අත් හැරීම ප්‍රකාරව යම් හෙයකින් නිකුතුව කෙරෙහි අධි ඉල්ලුමක් පැවතියහොත්, ඡන්ද හිමි සාමාන්‍ය කොටස් පහත සඳහන් ආකාරයෙන් විභජනය කිරීමේ අයිතිය එස්ඩීබී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

| ආයෝජක කාණ්ඩය | ද්.ම.නි. විභජනය (%) |
|---|---|
| එස්ඩීබී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි හඳුනාගත් ආයෝජකයින් | 50.0% |
| එස්ඩීබී බැංකුවේ වත්මන් කොටස් හිමියන්* | 37.5% |
| අනෙකුත් ආයෝජකයින්* | 12.5% |
| | 100.0% |

*කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව, එස්ඩීබී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම නිකුතුවේ කොටස්වලින් 20% ක් පාරිභෝගික (retail) තනි ආයෝජකයන් වෙත වෙන් කිරීම සිදු කල යුතුය. එනමුත් මෙම රීතියෙන් පෙර සඳහන් කල පරිදි බැංකුව නිදහස් කිරීමට කොළඹ කොටස් හුවමාරුව විසින් ලබා දුන් අනුමැතියට යටත්ව, මෙම නිකුතුව සඳහා ඉහත කී එක් එක් වර්ගයේ ආයෝජකයින් දරණ දායකත්වයේ මට්ටම් සලකා බැලීමෙන් අනතුරුව, යම් හෙයකින් පාරිභෝගික තනි ආයෝජකයන් විසින් අඩු දායකත්වයක් (Undersubscription by the Retail Individual Investors) දරණ අවස්ථාවකදී, බැංකුව විසින් දායක නොවූ (Unsubscribed Shares) කොටස් ඉහත අනෙකුත් ආයෝජකයින් වෙත ලබා දෙනු ලැබේ.

ආයෝජකයින් වෙත ද්.ම.නි. තුළින් කොටස් විභජනය කරනු ලබන්නේ, 1988 අංක 30 දරණ බැංකු පනත (සංශෝධිත පරිදි) ප්‍රකාරව පනවා ඇති කොටස් හිමිකාරිත්වය දැරීමේ සීමා කිරීම් වලට යටත්වය.

## 3. නිකුතුවේ අරමුණු

### 3.1. නිකුතුවෙන් රැස් කර ගනු ලබන මුදල් වල උපයෝගිතාව

ද්විතියික මහජන නිකුතුවෙන් රැස් කර ගනු ලබන මුදල් පහත සඳහන් අරමුණු සපුරා ගැනීම පිණිස උපයෝගී කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**1 වන අරමුණ : බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තවදුරටත් සවිබල ගැන්වීම සහ ඒ තුලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාසල් III මාර්ගෝපදේශ යටතේ නිශ්චිතව දක්වා ඇති පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවන් වැඩි දියුණු කර ගැනීම.**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 මාර්තු 27 දිනැති ලිපිය අනුව, පද්ධතිමය වැදගත්කමක් නොමැති දේශීය බැංකුවක් (Non D-SIB) ලෙස එස්ඩීබී බැංකුවට අදාළ වන, ප්‍රතිශෝධිත නියාමන අවම ප්‍රාග්ධන මට්ටම් අනුපාතයන් පහත 1 වැනි වගුවේ අනාවරණය කර ඇත.

1 වැනි වගුව : බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිලිබඳ විග්‍රහය

| ප්‍රාග්ධන සංරචක | ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිලිබඳ නියමයන් | | බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිලිබඳ මට්ටම | | |
|---|---|---|---|---|---|
| | අවම නියාමන අවශ්‍යතාව (බැංකු පනත අනුව, 2016 දෙසැම්බර් මස 29 දිනැති 2016 අංක 01 දරණ විධානය) | ප්‍රතිශෝධිත නියාමන අවමය (ශ්‍රී.ලං.ම.බැ. 2020 මාර්තු 27 දිනැති ලිපියට අනුකූලව) | ප්‍රාග්ධන ප්‍රමාණවත්බව පිලිබඳ මට්ටම (2020 දෙසැම්බර් 31 දිනට) | මූලික නිකුතුවෙන් පසු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව පිලිබඳ මට්ටම (එනම්, මූලික නිකුතුවට කොටස්කරුවන් සම්පූර්ණයෙන් දායක වූවා යැයි සැලකූ විට) | සමස්ථ නිකුතුවෙන් පසු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව පිලිබඳ මට්ටම (එනම්, සමස්ථ නිකුතුවට කොටස්කරුවන් සම්පූර්ණයෙන් දායක වූවා යැයි සැලකූ විට) |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක සහිත පළමු පෙළ කොටස් ප්‍රාග්ධනය | 7.00 % | 6.5 % | 9.85 % | 13.80 % | 14.96 % |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක සහිත පළමු පෙළ මුළු ප්‍රාග්ධනය | 8.50% | 8.0% | 9.85% | 13.80% | 14.96 % |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක සහිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 12.50% | 12.0% | 13.38% | 17.34% | 18.50 % |

සටහන : මූලික නිකුතුවේ සහ සමස්ථ නිකුතුවේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 2021.04.23 දින වන විට මසක (01) පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල(Volume Weighted Average Price) වූ ශ්‍රී ලංකා රු.54.90 (ආසන්නතම ශත 10 ට වැටයීමෙන් පසු) ක මිල සලකා බලන ලදී. (චක්‍රලේඛය කොටස්හිමියන් වෙත යැවීමට පෙර ප්‍රයෝගික වන ආසන්නතම දිනය) අතිවිශේෂ මහා සභා රැස්වීමේ දිනට වෙළඳපොල දින තුනකට (03) පෙර, බැංකුව විසින් ද්විතියික මහජන නිකුතුවේ කොටසක නිකුතු මිල වෙළඳපොල වෙත දැනුම් දෙනු ලැබේ. (2021 මැයි මස 20)

මෙම නිකුතුව හරහා යෝජිත ප්‍රාග්ධන වර්ධනය මගින්, 2020 දෙසැම්බර් මස 31 වන දිනට පැවති බැංකුවේ මුළු ප්‍රාග්ධනය වූ ශ්‍රී ලංකා රු. 12,634,452,222 සිට ශ්‍රී ලංකා රු. 17,465,652,222 (2021 අප්‍රේල් 23 වන දින වන විට මසක (01) පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල වන ශ්‍රී ලංකා රු.54.90 (ආසන්නතම ශත 10 ට වැටයීමෙන් පසු) මත පදනම්ව) ක් දක්වා වර්ධනය කර ගැනීමට බැංකුවට හැකියාව ලැබේ.

කොටස්හිමියන් සම්පූර්ණයෙන් දායක වූ මූලික නිකුතුව සහ සමස්ත නිකුතුවෙන් පසුව බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල වන ශ්‍රී ලංකා රු.54.90 මත පදනම්ව ඉහත සඳහන් අංක 1 වගුවේ සඳහන් කර තිබේ. තවද එස්ඩීබී බැංකුවේ අවසන් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා තත්ත්වය, මිල නිශ්චය කරනු ලබන දිනට අදාළ නිකුතු මිල සහ නිකුතුව මගින් විභජනය කරනු ලබන කොටස් සංඛ්‍යාව මත තීරණය වේ.

**2 වන අරමුණ : බැංකුවේ ණය කළඹේ වර්ධනය සම්බන්ධයෙන් ආංශික වශයෙන් අරමුදල් සම්පාදනය කිරීම.**

මෙම නිකුතුව හරහා රැස් කර ගැනීමට නියමිත අරමුදල් බැංකුවේ 2021 සහ 2022 මූල්‍ය වර්ෂයන් තුළ ප්‍රධාන වශයෙන් පාරිභෝගික ණය අංශයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ගනුදෙනුකරුවන් ඉලක්ක කර ගනිමින් කුඩා හා මධ්‍ය කාලීන මූල්‍ය සහන සැපයීම ද ඇතුළුව බැංකුවේ සැලසුම්ගත ණය වර්ධනය සපුරාලීම පිණිස උපයෝගී කර ගනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දින වන විට දළ ණය කළඹ ශ්‍රී.ලං.රු. බිලියන 106.0 ක් දක්වා වර්ධනය වී ඇති අතර, එය 2019 දෙසැම්බර් 31 දිනට පැවති ණය කළඹට සාපේක්ෂව 19.45% ක වැඩිවීමකි. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුවේදී, ණය සහ අත්තිකාරම් මුදාහැරීමේ මාසික සාමාන්‍ය ශ්‍රී ලංකා රුපියල් බිලියන 7.335 කි. කොවිඩ් 19 වසංගත රෝග ව්‍යාප්තියේ බලපෑම හේතුවෙන් බැංකුවට සහ එහි ව්‍යාපාරික

ක්‍රියාකාරිත්වයට සිදු වූ බලපෑම, 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අතුරු මූල්‍ය ප්‍රකාශයේ පැහැදිලි කිරීමේ සටහන් වල 6 වන සටහනෙන් (Note 6 of the Explanatory Notes) දක්වා ඇත.

ද්විතියික මහජන නිකුතුව හරහා කොටස් විභජනය කිරීම තුලින් ඉහත කී පළමු අරමුණ සාක්ෂාත් කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි. තවද නිකුතුවෙන් රැස් කර ගන්නා ලද මුදල් බැංකුවේ අපේක්ෂිත ණය ඉල්ලුම මත පදනම්ව 2022 මූල්‍ය වර්ෂය අවසන් වීමට පෙර ඉහත සඳහන් දෙවැනි අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා උපයෝගී කර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

එකී මුදල් ඉහත හඳුනාගත් දෙවැනි අරමුණ සඳහා උපයෝගී කර ගන්නා තෙක් ඉන් උපයෝගී කර නොගත් මුදල් ශූන්‍ය ගෙවීම් පැහැර හැරීමේ අවදානමක් සහිත රජයේ සුරැකුම්පත් වල හෝ බලපත්‍රලාභී වාණිජ බැංකු ස්ථාවර තැන්පතු වල සහ පවතින එක්දින ප්‍රති මිලදී ගැනීම් අනුපාතයට (overnight REPO rate) සමාන අවම ප්‍රතිලාභයක් ලබා දෙන මූල්‍ය වෙළඳපොල අරමුදල් වල ආයෝජනය කිරීම සඳහා ආයෝජන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට බැංකුව විසින් අපේක්ෂා කරනු ලැබේ. වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුවේ උප කමිටුවක් වන, ආයෝජන කමිටුව, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, භාණ්ඩාගාර ප්‍රධානී, ණය ප්‍රධානී, අලෙවි ප්‍රධානී සහ මූල්‍ය ප්‍රධානී ඇතුළු සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත වේ.

බැංකුව විසින් නිකුතුව හරහා ලද මුදල් ණයට දීම සඳහා කිසිදු සම්බන්ධිත පාර්ශවයක් මෙම චක්‍රලේඛයේ සඳහන් වන දිනය වන විටත් හඳුනා ගෙන නොමැති අතර, එබැවින් බැංකුව විසින් එකී මුදල් සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාමේදී අනුගමනය කරන පිළිවෙලට ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. යම් හෙයකින්, මෙම නිකුතුවෙන් ලද මුදලින් යම් කොටසක් කිසියම් සම්බන්ධිත පාර්ශ්වයකට ගෙවීමට බැංකුව විසින් තීරණය කරන විටකදී, එකී ගෙවීම බැංකු පනත හා එහි විධිවිධාන මෙන්ම කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතීන්හි 9 වන වගන්තියට අනුකූලව සිදු කරනු ලැබේ.

මෙම නිකුතුවේ අභිමතාර්ථයන් සමාගම් පනතේ විස්තර කෙරෙන ප්‍රධාන ගනුදෙනු යටතට අදාළ නොවනු ඇත.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ අධ්‍යක්ෂ මණ්ඩල සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සමාලෝචන කමිටුවේ සංයුතිය, බැංකුවේ වෙබ් පිටුවේ "වාර්ෂික වාර්තාව - 2020" යන සිරස්තලය යටතේ https://www.sdb.lk/en/investor-relations/annual-reports සහ කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවිය හරහා https://www.cse.lk/home/company-info/SDB.N0000/financial ලබා ගත හැකිය.

### 3.2. අරමුදල් රැස්කිරීමේ ප්‍රතිලාභ

සාර්ථක ද්විතියික මහජන නිකුතුව මගින් ජනිත වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා මට්ටමේ ප්‍රගතිය තුලින් එස්ඩීබී බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධන මට්ටම සවි බලගැන්වෙන බවත්, එමගින් ඉදිරි මූල්‍ය වසර තුන හතරක කාලයක් සඳහා බැංකුවේ අපේක්ෂිත වත්කම් වර්ධනයට සහායක් වනු ඇතැයි බලාපොරොත්තු වේ. මේ තුළින් බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වල ස්ථාවරත්වය තවදුරටත් වැඩි දියුණු වීමක් සිදු වන අතර, කොටස්හිමියන්ට මෙන්ම නව ආයෝජකයින්ට බැංකුවේ වර්ධනයට දායක වීමට අවස්ථාවක් හිමි වීමෙන් අපේක්ෂිත ලාභදායිත්වයේ වැඩිවීම ඔස්සේ අනාගතයේ ලැබෙන ප්‍රතිලාභ ලබා ගැනීමටත් ඔවුන්ට හැකිවනු ඇත.

ප්‍රාග්ධන මට්ටම සවිබලගැන්වීම හේතුවෙන් මනා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා මට්ටමක් පවත්වාගෙන යාමට හැකිවන අතර, එමගින් බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ යාමෙන් අවම පිරිවැයක් සහිත

විකල්ප අරමුදල් මාර්ගයන් කෙරෙහි යොමු වීමටත් එමගින් බැංකුවේ ණය කළඹ සහ ලාභදායිත්වය තවදුරටත් වැඩි දියුණු කර ගැනීමටත් හැකිවනු ඇත.

**3.3. නිකුතුවේ අරමුණු සම්බන්ධ සුවිශේෂී අවදානම්**

ද්විතියික මහජන නිකුතුව හරහා රැස් කිරීමට යෝජිත මුදල මගින්, බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (නිකුතුවෙන් පසු) සවිමත්වීම සහ 1 වන අරමුණ සපුරාලීම සිදු වේ. බැංකුවේ ප්‍රධාන කොටස්හිමියන් කීපදෙනෙක් සහ බාහිර ආයෝජකයින් කීපදෙනෙක් මෙම නිකුතුවට දායක වීමට ප්‍රතිපත්තිමය වශයෙන් කැමැත්ත දක්වා තිබේ.

යම් හෙයකින්, මෙම නිකුතුවට කොටස්හිමියන් පූර්ණ වශයෙන් දායකත්වය නොදැක්වුවහොත්; බැංකුව විසින් විකල්ප වශයෙන් අදාල නියාමනයන්ගේ හා කොටස්හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව, පෞද්ගලික නිකුතුවක් (Private Placement) මගින් බාහිර ආයෝජකයන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාග්ධනය රැස් කිරීමේ ක්‍රියා මාර්ගයක් සහ BASEL III රෙගුලාසි වලට අනුකූල වන ණය සාධන පත්‍ර (BASEL III Complaint Debt Instruments) යොදා ගැනීම කල හැකිය. තවදුරටත් බැංකුව විසින් ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා ඉහත සඳහන් කරන ලද යම් විකල්ප ක්‍රියා මාර්ගයක් භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව අවශ්‍ය කරන්නා වූ අනාවරණය කිරීම් කොටස්හිමියන් වෙත කරනු ලැබේ.

බැංකුවේ ව්‍යාපාර කටයුතු වල ස්වභාවය අනුව හා වර්තමානයේ ණය සඳහා පවතින ඉල්ලුම සැලකිල්ලට ගත්කල බැංකුව විසින් ඉහත කී අරමුණු වලින් බැහැර වීමක් හෝ ඉහත දක්වා ඇති පරිදි නිකුතුව මගින් රැස් කර ගන්නා ලද අරමුදල් නියම කරන ලද කාල සීමාව තුල යෙදවීමේ ප්‍රමාදයක් සිදු වේ යැයි බැංකුව කිසි විටකත් අපේක්ෂා නොකරයි. කෙසේ වුවත්, මෙම නිකුතුව තුළින් උපයන මුදල්, ඉහත කී කාර්යයන්ගෙන් පරිබාහිර කාර්යයක් සඳහා යොදවන්නේ නම් හෝ එකී අරමුණු ළඟා කර ගැනීම සඳහා නියම කරන ලද කාල සීමාවන්ගෙන් යම් බැහැර වීමක් සිදු වන්නේ නම් හෝ යම් අරමුණක් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන්ගෙන් බැහැර වීමක් සිදු වන්නේ නම්, බැංකුව විසින් කොටස්හිමියන් වෙත කොළඹ කොටස් හුවමාරුව හරහා අවශ්‍ය අනාවරණය කිරීම් සිදු කිරීමටත්, යෝග්‍ය වන පරිදි අතුරු මූල්‍ය ප්‍රකාශ සහ වාර්ෂික වාර්තාවේ එකී අනාවරණය කිරීම් සිදු කිරීමටත් අවශ්‍ය පියවර ගනු ඇත. තවද එම අවස්ථාවේදීම යෝග්‍ය වන පරිදි කොටස්හිමියන් ද ඇතුළුව අදාළ පාර්ශවකරුවන්ගේ අනුමැතිය ලබා ගැනීමට ද බැංකුව විසින් අවශ්‍ය පියවර ගනු ලබයි.

මෙම නිකුතුව ඔස්සේ උපයන ලද මුදල් උපයෝගී කර ගැනීම සම්බන්ධ තොරතුරු, අරමුදල් රැස් කර ගන්නා දින සිට අදාළ අරමුණු සාක්ෂාත් කර ගන්නා තුරු බැංකුව විසින් වාර්ෂික වාර්තාවේ සහ අතුරු මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කරන අතර, එකී අරමුදල් පහත වගුවේ දැක්වෙන ආකෘතියට අනුව ඉදිරිපත් කරනු ලැබේ.

.............................. දිනට නිකුතුව හරහා රැස් කර ගන්නා මුදල් උපයෝගී කර ගැනීම.

| අරමුණු අංකය | නිකුත් කිරීමේ අරමුණු | වෙන් කරන ලද මුදල (ශ්‍රී.ලං.රු.මිලි.) | නිකුතුවෙන් රැස් කර ගන්නා ලද මුදල් උපයෝගී කර ගැනීමට යෝජිත දිනය | රැස් කරන ලද මුදල්වලින් වෙන් කරන ලද මුදල (ශ්‍රී.ලං.රු.මි.) (අ) | රැස් කරන ලද මුළු මුදල් වලින් % | උපයෝගී කරගත් මුදල (ශ්‍රී.ලං.රු. මිලි) (ආ) | වෙන්කිරීම වලට සාපේක්ෂව උපයෝගී කර ගැනීමෙ % (ආ/අ) | අරමුදල් සම්පූර්ණයෙන්ම උපයෝගී කර නොගන්නේ ඒ සඳහා නම් පැහැදිලි කිරීම (නිදර්ශනය : සම්බන්ධිත පාර්ශ්වයන්ට ණයට දුන්නේද යන වග) |
|---|---|---|---|---|---|---|---|---|
| **01.** | බැංකුවේ ව්‍යාපාර කොටස් පදනම තවදුරටත් සවිබල ගැන්වීම සහ ඒ තුලින් පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීම. | | නිකුතුව හරහා කොටස් විභජනය මත | | | | | |

වාර්ෂික වාර්තාවේ සහ අතුරු මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කල යුතුය.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **02.** | බැංකුවේ ණය කළඹේ වර්ධනය සම්බන්ධයෙන් ආංශික වශයෙන් අරමුදල් සම්පාදනය කිරීම. | | 2022 මූල්‍ය වර්ෂය අවසන් වීමට පෙර | | | | | |

නිකුතුවෙන් රැස් කර ගනු ලබන මුදල් මූල්‍ය කාල පරිච්ඡේද දෙකක් අතර කාලයේදී, බැංකුව විසින් නිකුත් කරන ලද කොටස්හිමියන් සඳහා වන චක්‍රලේඛයේ / සංස්ථා ප්‍රකාශයේ හෙළිදරව් කර තිබෙන අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම උපයෝගී කර ගනු ලැබූ අවස්ථාවකදී, බැංකුව විසින් එසේ සම්පූර්ණයෙන්ම උපයෝගී කර ගැනීමෙන් අනතුරුව එම කරුණ, නිකුත් කරනු ලබන ආසන්නතම වාර්ෂික වාර්තාවේ හෝ අතුරු මූල්‍ය ප්‍රකාශ වල ඉහත ආකෘතිය ප්‍රකාරව හෙළිදරව් කිරීමට බැංකුව විසින් කටයුතු කරනු ඇත.

## 4. ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල (Underwriting Arrangement)

මෙකී නිකුතුව සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙලකට එළඹී නොමැත. කෙසේ වුවත් බැංකුවේ ප්‍රධාන පෙළේ කොටස්හිමියන් කිහිපදෙනෙකු සහ බාහිර ආයෝජකයින් කිහිපදෙනෙකු ,මෙම නිකුතුවට දායකත්වය සපයන බවට මූලික කැමැත්ත දක්වා තිබේ.

## 5. ප්‍රාග්ධන ව්‍යුහය

මහජනයා විසින් නිකුතුව සඳහා පූර්ණ වශයෙන්ම දායකත්වය සපයනු ඇති බවට සිදුකළ උපකල්පනය මත (එනම් මූලික සහ වැඩිදුර යන නිකුතු දෙක සඳහාම) බැංකුවේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ආසන්න වශයෙන් පහත පරිදි වේ.

| | ද්විතියික මහජන නිකුතුවට පෙර | මූලික නිකුතුව හරහා (ද්විතියික මහජන නිකුතුව යටතේ ) | මූලික නිකුතුවට පසු (ද්විතියික මහජන නිකුතුව යටතේ) | වැඩිදුර නිකුතුව මගින් (ද්විතියික මහජන නිකුතුව යටතේ උපරිම කොටස් සංඛ්‍යාව නිකුත් වේ යැයි යන උපකල්පනය මත) | ද්විතියික මහජන නිකුතුවට පසු (මුළු නිකුතුව සඳහා පූර්ණ වශයෙන්ම දායක වේ යැයි යන උපකල්පනය මත) |
|---|---|---|---|---|---|
| ඡන්ද හිමි සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 91,576,032 | 68,000,000 | 159,576,032 | 20,000,000 | 179,576,032 |
| වටිනාකම (ශ්‍රී.ලං.රු.) | 7,727,941,021 | 3,733,200,000 | 11,461,141,021 | 1,098,000,000 | 12,559,141,021 |

මූලික නිකුතුවේ සහ මුළු නිකුතුවේ මිල ආසන්න මිලට ගෙන ඒම අරමුණු කරගෙන, 2021.04.23 දින වන විට මසක (01) පරිමාණ බර තැබීමේ සාමාන්‍ය මිල වන ශ්‍රී ලංකා රු.54.90 (ආසන්නතම ශත 10 ට වැටයිමෙන් පසු) ක මිල සලකා බලනු ලැබේ. (චක්‍රලේඛය කොටස්හිමියන් වෙත යැවීමට පෙර ප්‍රයෝගික වන ආසන්නතම දිනය) අති විශේෂ මහා සභා රැස්වීමේ දිනට වෙළඳපොල දින තුනකට (03) පෙර, බැංකුව විසින් ද්විතියික මහජන නිකුතුවේ කොටසක නිකුතු මිල වෙළඳපොල වෙත දැනුම් දෙනු ලැබේ. (2021 මැයි මස 20)

## 6. වෙළඳපොල කාර්ය සාධනය

2021 අප්‍රේල් මස 23 වන දිනට (එනම් චක්‍රලේඛය කොටස්හිමියන් වෙත යැවීමට පෙර ප්‍රයෝගික වන ආසන්නතම දිනට) එකී බැංකුවේ කොටස් වල වෙළඳපොල මිල රු.50.60 ක් වේ.

2021 ජනවාරි මස 01 සිට 2021 අප්‍රේල් මස 23 වන දින දක්වා කාල සීමාව තුළ බැංකුවේ ඡන්ද හිමි සාමාන්‍ය කොටස්වල උපරිම මිල, අවම මිල හා අවසාන විකුණුම් මිල, කොටස් ගනුදෙනු ප්‍රමාණය සහ කොටස් ධාරිතාව පහත දැක්වේ.;

| මාසය | උපරිම මිල (රු.) | අවම මිල (රු.) | වෙළඳපොල දින සමාප්තියේ මිල (රු.) | කොටස් ගනුදෙනු ප්‍රමාණය | කොටස් ධාරිතාවය |
|---|---|---|---|---|---|
| ජනවාරි | 68.50 | 55.00 | 62.80 | 3,752 | 5,414,652 |
| පෙබරවාරි | 65.50 | 55.00 | 58.00 | 1,829 | 2,594,539 |
| මාර්තු | 59.90 | 53.50 | 56.80 | 952 | 1,180,931 |
| අප්‍රේල් * | 58.00 | 50.50 | 50.60 | 1,039 | 726,955 |

*මූලාශ්‍රය : කොළඹ කොටස් හුවමාරුවේ මාසික විස්තරය*
** 2021 අප්‍රේල් 23 දක්වා*

## 7. නිකුතුව සම්බන්ධ ප්‍රකාශන සහ අනුමැතීන්

මෙම ද්විතියික මහජන නිකුතුව බලාත්මක වනුයේ එකී අරමුණ සඳහා කැඳවනු ලබන අතිවිශේෂ මහා සභා රැස්වීමේදී විශේෂ යෝජනාව සඳහා කොටස්හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම හා ඉන් අනතුරුව නිකුතුව සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය (in principle approval) ලබා ගැනීමත් සමග වේ. මෙහි සඳහන් අනුමැතීන් හැර යෝජිත නිකුතුව සඳහා වෙනත් අනුමැතියක් අවශ්‍ය නොවන බව බැංකුව තවදුරටත් තහවුරු කර සිටියි.

යම් මිල සංවේදී කරුණක් හෝ වෙනත් වැදගත් තොරතුරක් වේ නම්, ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් වෙළෙඳපොල යාවත්කාලීන කරනු ලැබේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් මෙම ද්විතියික මහජන නිකුතුව යටතේ නව ඡන්ද හිමි සාමාන්‍ය කොටස් ලැයිස්තුගත කිරීම, මෙම නිකුතුවේ කුසලතාවය මත කිසිසේත් පිලිබිඹු නොවනු ඇත. සිදු කරන ලද කිසිදු ප්‍රකාශයක්,පල කරන ලද යම් අදහසක් හෝ ඇතුලත් කරන ලද වාර්තා වල නිරවද්‍යතාව පිළිබඳව, කොළඹ කොටස් හුවමාරුව විසින් කිසිදු වගකීමක් භාර නොගනී.

මෙහි සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක්ව හා වෙන් වෙන්ව සම්පූර්ණ වගකීම භාර ගනු ලබන අතර, සියලු සාධාරණ විමර්ශන වලින් පසුව ඔවුන්ගේ දැනීම හා විශ්වාසය අනුව, මෙම චක්‍රලේඛයේ සපයා ඇති ප්‍රකාශ වල නොමගයවනසුළු කරුණු හෝ මග හැරී නොමැති බවට සහතික කර සිටිනු ලැබේ.

## 8. කොටස්හිමියන්ගේ තොරතුරු

2021 මාර්තු මස 31 දිනට බැංකුවේ විශාලතම කොටස්හිමියන්

| නම | සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | % |
|---|---|---|
| අයෙන්කා හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම | 11,434,399 | 12.4862 |
| සෙලාන් බැන්ක් පී එල් සී / සෙන්තිල්වර්ල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම | 10,589,455 | 11.5636 |
| Nederlandse Financierings-Maatschappij Voor Ontwikkelinglanden N.V. | 9,157,603 | 10.0000 |
| සීබී එන්වයි එස් / ඒ ඉන්ටර්නැෂනල් ෆයිනෑන්ස් කෝපරේෂන් | 5,414,163 | 5.9122 |
| එස්බීඅයි එමර්ජින් ඒෂියා ෆයිනෑන්ෂියල් සෙක්ටර් ෆන්ඩ් (පුද්ගලික) සමාගම | 2,885,618 | 3.1511 |

| | | |
|---|---|---|
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී / එල් පී හපන්ගම | 2,414,838 | 2.6370 |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී | 2,271,260 | 2.4802 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී /අයෙන්කා හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම | 2,170,554 | 2.3702 |
| එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී | 2,066,310 | 2.2564 |
| සම්පත් බැන්ක් පී එල් සී / ආචාර්ය ටී සෙන්තිල්වර්ල් | 1,664,710 | 1.8178 |
| සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් (ලයිෆ්) | 1,481,692 | 1.6180 |
| කේගෝල් සණස ෂෙයාර්හෝල්ඩර්ස් ට්‍රස්ට් කම්පැණි ලිමිටඩ් | 1,247,746 | 1.3625 |
| සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් (ජෙනරල්) | 1,204,934 | 1.3158 |
| සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | 1,124,418 | 1.2279 |
| සී/ස පොල්ගහවෙල සණස සමිති සංගමය | 820,098 | 0.8955 |
| සණස ෆෙඩරේෂන් ලිමිටඩ් | 780,970 | 0.8528 |
| හැටන් නැෂනල් බැන්ක් පී එල් සී / ජෙරාඩ් ෂමිල් නිරන්ජන් පීරිස් මහතා | 515,619 | 0.5631 |
| සම්පත් බැන්ක් පී එල් සී / අරුණාසලම් සිතම්පලම් මහතා | 464,981 | 0.5078 |
| ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී / එන් ජී එන් මධුරංග | 425,066 | 0.4642 |
| සී/ස හම්බන්තොට දිස්ත්‍රික් සණස සමිති සංගමය | 416,782 | 0.4551 |
| උප එකතුව | **58,551,216** | **63.9374** |
| අනෙකුත් කොටස්හිමියන් | 33,024,816 | 36.0626 |
| එකතුව | **91,576,032** | **100** |

2021 මාර්තු 31 දිනට බැංකුවේ පොදු සංචලනය (Public Float) 84.718 % ක් විය.

යෝජිත ද්විතියික මහජන නිකුතුවෙන් අනතුරුව බැංකුවේ අවසන් පොදු සංචලන ප්‍රමාණය තීරණය වන්නේ බැංකුවේ පොදු නොවන කොටස්හිමියන් (Non-public Shareholders) විසින් නිකුතුවට දරණ දායකත්වය මත වේ. කෙසේ වුවත් මෙම නිකුතුවෙන් පසුව වුවද බැංකුවේ පොදු සංචලනය, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතීන් වල දක්වා ඇති අවශ්‍යතාවයන් තුල පවතී.

## 9. අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය

2021 මැයි මස 28 වන දින කැඳවනු ලබන අති විශේෂ මහා සභා රැස්වීමේදී ලබා ගැනීමට නියමිත කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්ව සහ ඉන් අනතුරුව නිකුතුව සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමට යටත්ව, ඉහත කී ආකාරයට ද්විතියික මහජන නිකුතුව සිදු කිරීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරනු ලැබේ.

## 10. අති විශේෂ මහා සභා රැස්වීම

මේ සමග අමුණා ඇති රැස්වීම පිළිබඳ නිවේදනයේ දක්වා ඇති පරිදි, අවශ්‍ය කරන්නා වූ යෝජනා සම්මත කර ගැනීමේ කාර්යය සඳහා බැංකුවේ අතිවිශේෂ මහා සභා රැස්වීම කැඳවනු ලැබේ.

වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කොටස්හිමියන්ගේ සහ සමස්ත සමාජයේම ආරක්ෂාව පතා, සෞඛ්‍ය බලධාරීන් විසින් පනවා ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව මෙම අතිවිශේෂ මහා සභා රැස්වීම "අතත්‍ය රැස්වීමක්" (Virtual Meeting) ලෙස පැවැත්වීමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

එබැවින්, මෙම අතිවිශේෂ මහා සභා රැස්වීම සඳහා කොටස්හිමියන් සූම් ක්‍රමය "Zoom Meeting platform" හෝ වෙනත් ක්‍රමයක් යොදාගෙන ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ පැවැත්වීමට බැංකුව විසින් පියවර ගනු ඇත. රැස්වීම පිළිබඳ නිවේදනයේ සඳහන් "අතිවිශේෂ මහා සභා රැස්වීම පැවැත්වෙන ආකාරය" යන කොටසෙහි මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු දක්වා ඇත.

එකී අතිවිශේෂ මහා සභා රැස්වීමට සහභාගී වීමට ඔබට නොහැකි වන්නේ නම්, ඔබ වෙනුවෙන් ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට ඔබට හිමිකමක් ඇත. ඒ අනුව මේ සමග එවා ඇති ප්‍රතියුක්තකයෙකු පත්

කිරීමේ සාධන පත්‍රය, නිසි පරිදි සම්පූර්ණ කර මෙම රැස්වීම පැවැත්වීමට නියම කර ඇති වේලාවට පැය 24 කට පෙරාතුව බැංකුවේ ලියාපදිංචි කාර්යාලය වෙත ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි. කොටස්හිමියන් විසින් න්‍යාය පත්‍රයේ අංග පිලිබඳ සිය මනාපය සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩලය තුල තමන් වෙනුවෙන් පෙනී සිටීමට බලය පැවරූ තැනැත්තා වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස්හිමියන් උනන්දු කරනු ලැබේ.

මෙයට විශ්වාසී,

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

ටාමරිකා රොද්‍රිගු
**සමාගම් ලේකම්**

**2021 මැයි මස 03 දිනදී ය.**

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
අතිවිශේෂ මහා සභා රැස්වීම
රැස්වීම පිළිබඳ නිවේදනය

2021 මැයි මස 28 වන දින පෙ.ව. 10.00 ට,"අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව",සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී, නො.12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06 දරණ ස්ථානයේ දී සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි කොටස්හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් අතත්‍ය ක්‍රමයෙන් පවත්වනු ලබන බවට මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

01. To consider and if thought fit, pass the following resolution by way of a special Resolution.

**Special Resolution**

"That the shareholders do hereby waive their right of pre-emption in terms of Article 4(1)(iii) of the Articles of Association of SDB Bank and that SDB Bank offer up to Sixty Eight Million (68,000,000) new Ordinary Voting Shares of SDB Bank by way of a Prospectus offering at an issue price based on the one (01) month Volume Weighted Average Price of SDB Bank share as at May 20, 2021 [i.e. three (03) market days before the Extraordinary General Meeting] (Issue Price) with an option to issue up to a further Twenty Million (20,000,000) new Ordinary Voting Shares of SDB Bank ("Further Issue") at the Issue Price in the event of an oversubscription of the initial issue ("Secondary Public Offering / SPO") and that from the date of allotment such shares shall rank equal and *pari passu* with the existing Ordinary Voting Shares in issue in SDB Bank."

විශේෂ යෝජනාව

"එස්ඩීබී බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවලියේ (Articles of Association) 4 (1)(iii) ව්‍යවස්ථාවේ සඳහන් පූර්වක්‍රය බල අයිතියෙන් (right of pre-emption) , කොටස් හිමි හවතුන් මෙයින් (resolved) මුදා හරින බවත් (waive their right), සංස්ථා ප්‍රකාශයක් (prospectus offering) තුලින් එස්ඩීබී බැංකුව නව ඡන්ද හිමි සාමාන්‍ය කොටස් මිලියන හැට අටක් (68,000,000) දක්වා අර්පනය කරන (offering) බවත්, එම අර්පනය කරනු ලබන නිකුතු මිල තීරණය වන්නේ 2021 මැයි මස 20 වන දිනටය. (අතිවිශේෂ මහා සභා රැස්වීම පැවැත්වෙන දිනට වෙළෙඳපොල දින තුනකට (03) පෙරාතුව) එස්ඩීබී බැංකුවේ කොටස් හි මසක (01) පරිමාණ බර තැබූ සාමාන්‍ය මිල (Volume Weighted Average Price) මත (නිකුතු මිල)(issue price) බවත්, එහිදී මූලික නිකුතුවේදී අධි ඉල්ලුමක් පැවතියහොත් තවත් මිලියන විස්සක් (20,000,000) දක්වා ඡන්ද හිමි සාමාන්‍ය කොටස් නිකුතුවක් (වැඩිදුර නිකුතුව)(further issue) සඳහා ඉඩ ප්‍රස්ථා පවතින පරිදි (ද්විතියික මහජන නිකුතුව / ද්.ම.නි.)(Secondary Public Offering / SPO) එකී කොටස්, එස්ඩීබී බැංකුවේ දැනට පවත්නා ඡන්ද හිමි සාමාන්‍ය කොටස් සමග සියලු ආකාරයෙන් සමාන තත්ත්වයෙන් (equal and *pari passu)* පවතිනු ඇත".

අති විශේෂ මහා සභා රැස්වීම පවත්වන ආකාරය

1. අති විශේෂ මහා සභා රැස්වීම බැංකුවේ සංගමික ව්‍යවස්ථාවලියට හා කොළඹ කොටස් හුවමාරුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව හා අදාළ නීති වලට යටත්ව අතත්‍ය රැස්වීමක් වශයෙන් පවත්වනු ලැබේ.

2. බැංකුවේ සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, ප්‍රධාන විධායක නිලධාරී , සමාගම් ලේකම් සහ බැංකුවේ අනෙකුත් නියෝජිතයන් හා එකී රැස්වීම පවත්වාගෙන යාමට, කටයුතු සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන පුද්ගලයින් ඉහත සඳහන් කල රැස්වීම පැවැත්වීමට නියමිත ස්ථානයට රැස් වේ. කොටස්හිමියන් ඇතුළු අනෙකුත් සියළු දෙනාම සූම් ක්‍රමය (ZOOM Meeting Platform) හරහා රැස්වීමට සහභාගී විය හැකි අතර ඒ සඳහා අනුගමනය කල යුතු පියවර පහත පරිදි වේ.

   අ) මෙම අතත්‍ය අති විශේෂ මහා සභා රැස්වීමට උනන්දුවක් ඇති සියලුම කොටස්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද පෝරම අංක 1 (Form 1) බැංකුවේ ලියාපදිංචි කාර්යාලයේ සිටින සමාගම් ලේකම් වෙත තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් (sdbegm@sdb.lk) මගින් හෝ 0112-514256 යන අංකය වෙත ෆැක්ස් පණිවිඩයක් එවීම මගින් රැස්වීම පැවැත්වීමට පැය 24 කට නොඅඩු කාලයකට පෙර එවිය යුතු අතර එමගින් අදාළ රැස්වීමට අතත්‍ය ලෙස සහභාගී වීමට අවශ්‍ය වන්නා වූ තොරතුරු (login Information) ඔබ වෙත ලබා දීමට බැංකුවට හැකියාව ලැබේ.

   ආ) රැස්වීමට සහභාගී වන සියලුම කොටස්කරුවන් රැස්වීම ආරම්භ වීමට පෙරාතුව මාර්ගගත ආකාරයෙන් (online) පූර්ව ලියාපදිංචි වීම සිදු කල යුතු අතර ඉන් ඔවුනට රැස්වීමට සහභාගී වීම සඳහා අවසර ලැබේ. එවැනි අවස්ථා වලදී පෝරම අංක 1 (Form 1) මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු, මාර්ගගත ලෙස පූර්ව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන තොරතුරු හා සමාන වන බවට කොටස්කරුවන් වගබලා ගත යුතුය.

3. රැස්වීමට සහභාගී වන කොටස්හිමියන් අතිවිශේෂ මහා සභා රැස්වීමේදී යම් විමසීමක් කිරීමට අදහස් කරන්නේ නම් සභාපතිවරයා විසින් කොටස්හිමියන්ගේ විමසීම් සඳහා වෙන් කරන ලද කාලයේදී තමාව හඳුන්වා දී එකී විමසීම් සිදු කල හැකිය. එහිදී තමා කොටස්හිමියකුද එසේ නොමැති නම් ප්‍රතියුක්තකයෙකු දැයි හඳුනා ගැනීම පහසු කිරීම පිණිස තම නම හා ලිපිනය ඔහු /ඇය විසින් ඉදිරිපත් කල යුතුය.

4. කොටස්කරුවන් හට තමන්ට ඇති ගැටළු බැංකුවේ ලියාපදිංචි කාර්යාලයේ සිටින සමාගම් ලේකම්වරිය වෙත තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් (sdbegm@sdb.lk) මාර්ගයෙන් හෝ අංක 0112-514256 වෙත ෆැක්ස් පණිවිඩයක් එවීම මගින්, රැස්වීම පැවැත්වීමට පැය 24 කට පෙරාතුව ඉදිරිපත් කල හැකි අතර ඒවා සැලකිය යුතු කරුණු යැයි සභාපතිවරයා සලකන්නේ නම් ඒවා සාකච්ඡාවට භාජනය වේ.

5. යම් කොටස්හිමියකුට රැස්වීමට සහභාගි වීමට නොහැකි නම්, ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රයේ සඳහන් යෝජනාව සඳහා මනාපය පැහැදිලිව සටහන් කර **"ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය"** නිසි පරිදි පුරවා, තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බැංකුවේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම සඳහා කොටස්හිමියන් උනන්දු කරන අතර, එවන් අවස්ථාවකදී එම කොටස්කරු රැස්වීම සඳහා සහභාගී නොවුනද එකී කොටස්හිමියාගේ ඡන්දය එකී රැස්වීමට සහභාගී වූ අයෙකුගේ ඡන්දයක් ලෙස සලකනු ලැබේ.

නිසි පරිදි පුරවන ලද ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය (දී ඇති උපදෙස් අනුව ) රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 24 කට පෙරාතුව සමාගම් ලේකම් වෙත එවීමෙන් ඔබගේ ප්‍රතියුක්තකයාට ඔබව නියෝජනය කිරීමේ හැකියාව මෙන්ම අතිවිශේෂ මහා සභා රැස්වීමේදී ඔබගේ උපදෙස් පරිදි ඡන්දය ලබා දීමට හැකියාව ඇත.

මෙම රැස්වීම පැවැත්වෙන්නේ අතත්‍ය ක්‍රමයට බැවින්, සියළු කොටස්හිමියන් තම ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය, පෝරම අංක 1 සමග රැස්වීම පැවැත්වීමට පැය 24 කට පෙරාතුව එවීමෙන් රැස්වීම කාර්යක්ෂමව පැවැත්වීමට හැකියාව ලැබේ.

6. වත්මන් වසංගත තත්වය මධ්‍යයේ වුවද සැලසුම් කළ පරිදි මෙම රැස්වීම පැවැත්වීමට, බැංකුව අදිටන් කරගෙන සිටී. බැංකුවේ කොටස්හිමියන් වෙත තවදුරටත් දැන්වීම් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒවා, කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් පිටුව www.cse.lk සහ / හෝ බැංකුවේ වෙබ් පිටුව https://www.sdb.lk/en/ මගින් සිදු වේ.

7. මෙම අතත්‍ය රැස්වීමට අවතීර්ණ වීමේ / සහභාගි වීමේ දී යම් තාක්ෂණික ගැටළුවක් මතු වුවහොත් 0112-832590 යන දුරකථන අංකය ඔස්සේ සමාගම් ලේකම් දෙපාර්තමේන්තුවට ඒ බව දැනුම් දිය හැක.

- මෙම අතත්‍ය රැස්වීමට සම්බන්ධ විය හැකි තොරතුරු සපයනු ලබන්නේ එක් එක් කොටස් හිමියන්ගේ/ ප්‍රතියුක්තකයන්ගේ සහ සමාගම් / ආයතනමය කොටස්හිමියන්ගේ බලයලත් නියෝජිතයින්ගේ භාවිතය සඳහා පමණි. එකී අතත්‍ය රැස්වීම් සම්බන්ධතා තොරතුරු අවභාවිතාවක් සිදු වුවහොත් බැංකුව ඒ පිළිබඳ කිසිදු වගකීමක් දරනු නොලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි
**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

ටාමරිකා රොද්‍රිගු
සමාගම් ලේකම්

2021 ක් වූ මැයි මස 3 දින දී ය.

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
අතිවිශේෂ මහා සභා රැස්වීම

**ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධනපත්‍රය**

1. කොටස්හිමියාගේ සම්පූර්ණ නම

   ..........................................................................................................................................

2. සමාගමේ ලියාපදිංචි අංකය / සණස සමිතියෙහි ලියාපදිංචි අංකය / කොටස්හිමියාගේ ජාතික හැඳුනුම්පත් අංකය ..........................................................................................................

3. කොටස්හිමියාගේ ලිපිනය

   ..........................................................................................................................................

4. සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) සහභාගි වීමට ;
   විද්‍යුත් තැපැල් ලිපිනය හා ජංගම දුරකථන අංකය

   ..........................................................................................................................................

   සණස ඩිවලොප්මන්ට් බැන්ක් හි කොටස්හිමියෙකු ලෙස මෙයින් පත් කර සිටින්නේ,

5. ප්‍රතියුක්තකයාගේ නම

   ..........................................................................................................................................

6. ප්‍රතියුක්තකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය

   ..........................................................................................................................................

7. ප්‍රතියුක්තකයාගේ ලිපිනය

   ..........................................................................................................................................

8. සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) සහභාගි වීමට ;

   විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථන අංකය

   ..........................................................................................................................................

ඔහු / ඇය සහභාගි වීමට අපොහොසත් වුවහොත්, සණස ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සභාපති ලක්ෂ්මන් අබේසේකර මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ ප්‍රභාශ් සුබසිංහ මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ එස්. ලයනල් තිලකරත්න මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ කේ.ජී. විජේරත්න මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ චාමින්ද කුමාරසිරි මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ ප්‍රසන්න ප්‍රේමරත්න මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ බී.ආර්.ඒ.බණ්ඩාර මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ දිනිති රත්නායක මහත්මිය හෝ ඇය අපොහොසත් වුවහොත් ජේ.ඒ.ලලිත් ජී. ජයසිංහ මහතා හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ තුසන්ත විජේමාන්න මහතා 2021 ක් වූ මැයි මස 28 වන දින කොළඹ 06 , කිරුළපන, එඩ්මන්ටන් පාර, නො 12, දරණ ස්ථානයේ පිහිටි සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි “අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී” පෙ.ව. 10.00 ට පැවැත්වෙන සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි අතිවිශේෂ මහා සභා රැස්වීමේ සහ ඊට අදාළව කල් තැබීමකදී සහ එයට ආනුශංගිකව පැවැත්විය හැකි ඡන්ද විමසීමකදී අප / මා වෙනුවෙන් ඡන්දය දීම සහ කතා කිරීම පිණිස අපගේ / මාගේ ප්‍රතියුක්තකයා වශයෙන් පත් කරමි / කරමු.

**පහත යෝජනා සම්මතය ඉදිරියේ "X" ලකුණ යොදා ඔබගේ මනාපය සලකුණු කරන්න.**

| | පක්ෂ | විපක්ෂ |
|---|---|---|
| 1. රැස්වීම කැඳවමින් මෙහි සඳහන් නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති විශේෂ යෝජනාව සම්මත කිරීම. | ☐ | ☐ |

**සමිති / සංගම් / ආයතන සඳහා**

.......................................................... ..........................................................

සභාපති උප සභාපති / ලේකම්

නිල මුද්‍රාව

.......................................................... ..........................................................

දිනය ප්‍රතියුක්තකයාගේ අත්සන

**පුද්ගලයන් සඳහා**

............................................ ............................................ ............................................

දිනය කොටස්හිමියාගේ අත්සන ප්‍රතියුක්තකයාගේ අත්සන

උපදෙස් :

1. නියමිත පරිදි හිස්තැන් පුරවා මුද්‍රා තබා නිසිලෙස සාධන පත්‍රය සම්පූර්ණ කළ යුතු වේ.

2. සම්පූර්ණ කරන ලද මෙම සාධන පත්‍රය, අති විශේෂ මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වෙලාවට පැය 24 කට පෙරාතුව පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් අදාල ඡන්දය වලංගු ඡන්දයක් සේ නොසැලකේ.

3. මෙම සාධනපත්‍රය පහතින්, බැංකුවේ ලිපිනය සඳහන් කර ඇති අතර එය නිසි පරිදි නවා තැපෑලෙන් අප වෙත නියමිත දිනට පෙර එවන්න.

4. ප්‍රතියුක්තකයෙකු පත් කරනු ලබන සාධන පත්‍රය පත් කිරීම කරනු ලබන තැනැත්තා විසින් අත්සන් කර හෝ ඔහුගේ/ ඇයගේ යථා පරිදි බලය පවරන ලද ඇටෝර්නි බලකරුගේ අත්සන යටතේ විය යුතු අතර එම පත් කරන්නා සංස්ථාවක් වන අවස්ථාවකදී එහි ඇටෝර්නි බලකරු හෝ යථා පරිදි බලයලත් තැනැත්තා විසින් අත්සන් කර පොදු මුද්‍රාව තබා ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රතියුක්තකයෙකු පත් කරනු ලබන සාධන පත්‍රය සමග බැංකුවේ ලියාපදිංචි කාර්යාලයෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

❖ **ප්‍රතියුක්තකයෙකු පත්කිරීමේ සාධන පත්‍රය සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද “ පෝරම අංක 1” වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට පැය 24 කට පෙර ඉදිරිපත් කල යුතුය.**

සමාගම් ලේකම්
**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**
අංක.12, එඩ්මන්ටන් පාර,
කිරුළපන,
කොළඹ 06

පෝරම අංක 1

සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) රැස්වීමට සම්බන්ධවීම සඳහා කොටස්හිමියන් විසින් සම්පූර්ණ කල යුතුය.

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

**අතිවිශේෂ මහා සභා රැස්වීම - 2021 මැයි මස 28 වන දින**

විද්‍යුත් තැපැල /ෆැක්ස්/තැපැල් /අතින් භාරදීම මගින්

සමාගම් ලේකම් වෙත,
සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

sdbegm@sdb.lk

| | | |
|---|---|---|
| කොටස්හිමියාගේ සම්පූර්ණ නම (හවුල් කොටස්හිමියෙක් නම් ප්‍රාථමික කොටස්හිමියාගේ සම්පූර්ණ නම සඳහන් කරන්න). | | |
| ජාතික හැඳුනුම්පත් අංකය / සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | | |
| දුරකථන අංකය | ජංගම | |
| | ස්ථාවර | |
| විද්‍යුත් තැපැල් ලිපිනය | | |
| | | |
| ප්‍රතියුක්තකයෙකු නම් කරන්නේ නම් *: | | |
| ප්‍රතියුක්තකයාගේ සම්පූර්ණ නම | | |
| ප්‍රතියුක්තකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය / විදෙස් ගමන් බලපත්‍ර අංකය | | |
| දුරකථන අංකය | ජංගම | |
| | ස්ථාවර | |
| විද්‍යුත් තැපැල් ලිපිනය | | |
| * ප්‍රතියුක්තකයෙකු පත්කිරීමේ සාධන පත්‍රය ඇමිණිය යුතුය. | | |

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හී අතිවිශේෂ මහා සභා රැස්වීමට පහත අත්සන් තබන අය හෝ මාගේ / අපගේ ප්‍රතියුක්තකයා අතත්‍ය ක්‍රමයෙන් සම්බන්ධ වනු ඇති බව මා විසින් / අප විසින් සහතික කරමි/කරමු. යම් හෙයකින් ප්‍රතියුක්තකයා පත් කරන්නේ නම්, යෝජනා සම්මතයට මාගේ / අපගේ ඡන්දය ලබා දෙන්නේ ප්‍රතියුක්තකයකු පත් කිරීමේ සාධන පත්‍රයේ දක්වා ඇති මනාපය පරිදි බව මම/අප පිළිගනිමි / පිළිගනිමු.

.........................................................................

කොටස්හිමියා / කොටස්හිමියන්ගේ අත්සන

1. ආයතනමය කොටස්හිමියෙකු සම්බන්ධයෙන් නම්, මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කල යුත්තේ එහි පොදු මුද්‍රාව (අදාළ වන්නේ නම්) හෝ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් ආයතනික ලියකියවිලිවල දක්වා ඇති ආකාරයෙනි.

2. මෙම ආකෘති පත්‍රය ඇටෝර්නි බලපත්‍රලාභියෙකු විසින් අත්සන් කර ඇත්නම්, බැංකුවේ ලියාපදිංචි කර ඇති එකී ඇටෝර්නි බලපත්‍රය හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කරන ලද එකී ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් නිසි පරිදි අමුණා තිබිය යුතුය.

3. මෙම පෝරමය , රැස්වීම පැවැත්වීමට පැය 24 කට පෙරාතුව, සමාගම් ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතුය.

4. මෙම පෝරමය, විද්‍යුත් තැපැල මගින් (sdbegm@sdb.lk) හෝ ෆැක්ස් මගින් (0112-514256) හෝ වැඩ කරන දින වල පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ ලැබෙන්නට සැලැස්විය යුතුය.

5. ඔබට යම් ගැටළුවක් පැන නැගී ඇත්නම්, කරුණාකර 0112-832590 යන දුරකථන අංකයට අමතන්න.